[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 26 දරන පෙරිය මවුලානා, ශෙයින් මවුලානා, ශියාරවල් සහ තකියාවල් සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **1999** අගෝස්තු මස **30** වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 සැප්තැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල රු. 4.50 යි    තැපැල් ගාස්තුව රු.3.50 යි.

# 1999 අංක 26 දරන පෙරිය මවුලානා, ශෙයින් මවුලානා, ශියාරවල් සහ තකියාවල් සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 30 වැනි දින.]

එල්.ඩී. - ඕ. 58/96.

## පෙරිය මවුලානා, ශෙයින් මවුලානා, ශියාරවල් සහ තකියාවල් සංවර්ධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"පෙරිය මවුලානා, ශෙයින් මවුලානා, ශියාරවල් සහ තකියාවල් සංවර්ධන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංවර්ධන සමිතිය එහි සාමාජිකයන් එකඟ වූ රීතීන්ට අනුකූලව එකී සංවර්ධන සමිතියට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද ; පූර්විකාව.

එකී සංවර්ධන සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ මෙතෙක් කල් එකී සංවර්ධන සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද ඒ සංවර්ධන සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මෙම පනත 1999 අංක 26 දරන, පෙරිය මවුලානා, ශෙයින් මවුලානා, ශියාරවල් සහ තකියාවල් සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "සංවර්ධන සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන පෙරිය මවුලානා, ශෙයින් මවුලානා, ශියාරවල් සහ තකියාවල් සංවර්ධන සමිතියේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු පෙරිය මවුලානා, ශෙයින් මවුලානා,ශියාරවල් සහ තකියාවල් සංවර්ධන සමිතිය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන සංස්ථාවක් වන්නේ ය. තවද, ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. පෙරිය මවුලානා, ශෙයින් මවුලානා, ශියාරවල් සහ තකියාවල් සංවර්ධන සමිතිය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) සිද්ධස්ථාන සහ තකියා මුස්ලිම් ආගමික වන්දනාස්ථාන පවත්වාගෙන යාම සහ පුනරුත්ථාපනය, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා සහායවීම ;

(ආ) ගෞරවාදරය දැක්වීමට හෝ දැක බලා ගැනීමට හෝ එවැනි වන්දනා ස්ථානවලට පැමිණෙන, එහි වන්දනා කරන, පිහිට පතන සහ විවේක ගන්නා හෝ ඉස්ලාමීය රීති දැක බලා ගැනීමට හෝ වැඳුම් පිදුම් හෝ යාඥා කිරීමට හෝ අදහස් කරන වන්දනා කරුවන්ගේ සුභ සාධනය, සුවපහසුව හා සමෘද්ධිය වැඩි දියුණු කිරීම ;

(ඇ) මුස්ලිම් ජාතිකයන්ගේ ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික සහ ආර්ථික සමෘද්ධිය පොදුවේ ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) ශියාරවලට හා තකියාවලට පැමිණෙන මුස්ලිම් ආගමේ දුප්පතුන්ට, අවශ්‍යතා ඇති අයට, රෝගීන්ට හා වැඩිහිටි අයට සහන සහ ආධාර සැපයීම ද පොදු මුස්ලිම් ජන සමූහයට සමාජසේවා, සියලුම ආකාරයේ අධ්‍යාපනික සහ පුහුණුවීමේ පහසුකම් ආදී වෙනත් සහන සැපයීම ;

(ඉ) කුරාණය සහ අරාබි භාෂාව, ඉගැන්වීම සඳහා මුස්ලිම් ආගමික පාසලක් පිහිටුවා එය පවත්වා ගෙන යාම ;

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ලම හෝ යමක් සාක්ෂාත් කරගැනීමට හිතකර හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද එහි අරමුදල් ආයෝජනය කිරීමේ හා වියදම් කිරීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කරවීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු, ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන භාරකාර මණ්ඩලයක් මගින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරුවා වූ ද, මෙහි උපලේඛනයේ නම් සඳහන් කර ඇත්තා වූ ද, සංවර්ධන සමිතියේ භාරකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සංස්ථාවට සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ අස්වීම හෝ ඔවුන් අස් කිරීම සම්බන්ධයෙන් ද, නිල දරන්නන්ගේ සහ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් ද, නිල දරන්නන්ගේ සහ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ බලතල, චර්යාව සහ කාර්යය සම්බන්ධයෙන් ද සංස්ථාවේ සහ භාරකාර මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එකී පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල එහි මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සෙයියදි ශෙයින් සක්කාෆ් මවුලානා පරම්පරාවෙන් පැවත එන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ රීති සෑදීමෙන් පසුව එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**7**. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත සතු වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ, විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා තත් කාලයේ වලංගුව පවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංවර්ධන සමිතිය විසින් ගෙවිය යුතු සහ සංවර්ධන සමිතියට අය විය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංවර්ධන සමිතිය විසින් ගෙවිය යුතුව තිබුණු සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංවර්ධන සමිතියට අය විය යුතුව තිබුණු සියලු ණය සහ ලැබිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

9. භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුවත් ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම් අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය [5 (2) වගන්තිය]

භාරකාර මණ්ඩලය

1. ගරුතර සෙයිඩ් ඔමර් සෙයින් බාරුල්බා අලවි මවුලානා

2. ගරුතර සෙයිඩ් අලි හිබ්ෂි මවුලානා

3. ගරුතර සෙයිඩ් ආප්තාබ් ඕමර් බාරුල්බා අලවි මවුලානා

4. ගරුතර සෙයිඩ් තාර්බිෂ් ඕමර් බාරුල්බා අලවි මවුලානා

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.